# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2081/50 – 2018 ජූලි 26 වැනි බ්‍රහස්පතින්දා – 2018.07.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**සිල්ලර හා තොග වෙළඳ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ සිල්ලර හා තොග වෙළඳ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති තීරණ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2018 අගෝස්තු මස 01 වැනි දින සිට වලංගු විය යුතුය.

**එස්. ඒ. එන්. සරණතිස්ස,**
ලේකම්,
කම්කරු, වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය.

2018 ජූලි මස 26 වැනි දින,
කොළඹ 05.

1A – PG4145 – 202 (2018/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

සිල්ලර හා තොග වෙළඳ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1990 පෙබරවාරි මස 28 වැනි දින අංක 599/12 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ වූ නිවේදනයේ, උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කලට වෙනස් කරන ලද්දා වූ ද, අවසන් වරට 2012 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1789/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දා වූ ද තීරණ එම උපේඛනයෙහි II වන කොටස වෙනුවට පහත සඳහන් නව කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය.

II වැනි කොටස

I වැනි තීරය

**සේවකයින්ගේ පන්තිය**

| | |
|---|---|
| I ශ්‍රේණිය | ගබඩාකරුවන්, පොත් තබන්නන්, අයකැමිවරුන්, කළමනාකරුවන්, ලඝුලේඛකයින්, ඩිස්පැන්සරිවරුන්. |
| II ශ්‍රේණිය | දුරකථන ක්‍රියාකරුවන්, ලිපිකරුවන්, යතුරු ලේඛකයින්, ලෙජර් ලිපිකරුවන්, ගිණුම් ලිපිකරුවන්, සහකාර අයකැමිවරුන්, පිරිවැය ලිපිකරුවන්, වේතන ලිපිකරුවන්, මුදල් යන්ත්‍ර ක්‍රියාකරුවන්, බිල් ලිපිකරුවන්. |
| III ශ්‍රේණිය | බිල්පත් එකතු කරන්නන්, විකුණුම්කරුවෝ, විකුණුම්කාරියෝ, හරි වැරදි බලන්නන් |
| IV ශ්‍රේණිය | කම්කරුවන්, බඩු බාහිරාදිය බෙදන ළමුන්, සාප්පු සේවකයින්, අසුරන්නන්, පණිවුඩකරුවන්, කවුන්ටර් සේවකයින්, ඕඩර්ලිවරුන්, බෑමේ සහ පැටවීමේ කම්කරුවන්, පොම්පකරුවන්, පාපැදිකරුවන්. |

II වන තීරය

**මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය**

| | සේවක පන්තිය | | | |
|---|---|---|---|---|
| සේවා වර්ෂය | I ශ්‍රේණිය<br>රු. ශත. | II ශ්‍රේණිය<br>රු. ශත. | III ශ්‍රේණිය<br>රු. ශත. | IV ශ්‍රේණිය<br>රු. ශත. |
| 1 වසර | 13,580.00 | 12,876.00 | 12,179.00 | 11,500.00 |
| 2 වසර | 13,755.00 | 13,026.00 | 12,304.00 | 11,600.00 |
| 3 වසර | 13,930.00 | 13,176.00 | 12,429.00 | 11,700.00 |
| 4 වසර | 14,105.00 | 13,326.00 | 12,554.00 | 11,800.00 |
| 5 වසර | 14,280.00 | 13,476.00 | 12,679.00 | 11,900.00 |
| 6 වසර | 14,455.00 | 13,626.00 | 12,804.00 | |
| 7 වසර | 14,630.00 | 13,776.00 | 12,929.00 | |
| 8 වසර | 14,805.00 | 13,926.00 | 13,054.00 | |
| 9 වසර | 14,980.00 | 14,076.00 | 13,179.00 | |
| 10 වසර | 15,155.00 | 14,226.00 | 13,304.00 | |

08 - 471

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.